# (උ) මිල හා වැටුප්.

## මිල.

සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් මාසිකව පළ කැරෙන පාරිභෝගික මිල දර්ශකය, පවුල් අය වැය සමීක්ෂණයකින් එළිදරව් කැරෙන පරිදි 1949 - 50 දී කොළඹ කම්කරු පන්තියේ පවුලක, පරිභෝජන රටාව පදනම් කොටගෙන සකස් කරනු ලැබුවකි. මිල වෙනස්වීම් පිළිබඳ සැසැඳුමට පදනම්ව, ඇති මේ මිල දර්ශකයෙහි ප්‍රධාන දුර්වලකම් දෙකක් ඇත. පළමුව මේ දර්ශකය නගරයේ කම්කරු පන්තියේ පවුල්වල ජීවන වියදමෙහි වෙනස්වීම් මැණීම සඳහා සැකසුනක් බැවින් මිල ඉහළයාම සපුරා විශ්ලේෂනය කිරීමෙහි ලා ඉන් ලැබිය හැකි ප්‍රයෝජනය සීමිතය. දෙවැනිව, කම්කරු පන්තියේ පාරිභොජන රටාව වුවද, ඉකුත් පහළොස් වසර තුළ සැලකිය යුතු පරිදි වෙනස්වූවා විය හැකිය එසේ වුවද, වඩාත් හොඳ වෙනත් දර්ශකයක් නොමැති නිසා, මේ දර්ශකය උපයෝගි කරගනු ලැබේ.

1956 න් පසු දර්ශකයෙහි හා එහි උප දර්ශකයන්හි ඇතිවූ වෙනස්වීම් II (උ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

**සංඛ්‍යා සටහන II (උ) 1**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය**

**(පාදය 1952 = 100)**

| වර්ෂය. | සියලුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර පාන | රෙදිපිළි | ඉන්ධන හා එළිය | ගෙවල් කුලී | විවිධ | දේශීය ගණය | ආනයන ගණය | අපනයන ගණය |
| 1956 .. | 100·2 | 103·3 | 81·8 | 101·3 | 101·5 | 98·6 | 100·0 | 99·0 | 115·1 |
| 1957 .. | 102·8 | 104·9 | 84·4 | 97·3 | 101·5 | 106·9 | 104·9 | 98·1 | 126·8 |
| 1958 .. | 105·0 | 105·8 | 87·5 | 101·0 | 101·5 | 113·1 | 109·2 | 97·0 | 135·0 |
| 1959 .. | 105·2 | 104·7 | 92·1 | 102·4 | 101·5 | 115·3 | 108·0 | 97·1 | 153·1 |
| 1960 .. | 103·5 | 100·8 | 95·1 | 102·7 | 101·5 | 117·5 | 108·9 | 93·7 | 138·4 |
| 1961 .. | 104 8 | 99·8 | 103·9 | 104·4 | 101·5 | 122·8 | 112·3 | 94·6 | 119·1 |
| 1962 .. | 106·3 | 100·9 | 108·2 | 105·6 | 101·5 | 124·9 | 113·9 | 96·7 | 113·8 |
| 1963 .. | 108·8 | 103·0 | 118·2 | 103·0 | 101·5 | 126·6 | 113·4 | 102·5 | 117·7 |
| 1964 .. | 112·2 | 106·4 | 127·2 | 103·2 | 101·5 | 129·3 | 116·7 | 106·6 | 115·3 |
| 1965 .. | 112 5 | 107·3 | 126·8 | 101·7 | 101·5 | 128·3 | 116·4 | 106·4 | 127·2 |

සංඛ්‍යා – සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව –

ඉහත සංඛ්‍යා සටහනෙහි පස් වැදෑරුම් භාණ්ඩ වර්ගකරණයෙන් සැලකිය යුතු ලක්ෂණ සමහරක් හෙළිවෙයි. පසුගිය අවුරුදු කීපය තුළදී තියුණු ලෙස වැඩි වෙමින් පැවති "සියළුම ශීර්ෂ" දර්ශකයෙහි වේගය 1965 දී සැලකිය යුතු අඩුමින් අඩුවිය. 1961 සිට 62 දක්වා සියයට 1·48 කින්ද, 1962 සිට 1963 දක්වා සියයට 2·35 කින්ද, 1963 සිට 1964 දක්වා සියයට 3·13 කින් දවැඩිවූ මේ දර්ශකය 1964 සිට 1965 දක්වා කාලය තුළ වැඩිවී ඇත්තේ සියයට 0·27 කින් පමණෙකි.

ඒ ඒ භාණ්ඩ ගණවල 1965 දී ඇතිවූ මිල වෙනස්වීම සසඳන කල, වැඩිවීමෙක් දක්නට ලැබෙන්නේ ආහාර ගණයෙහි පමණෙකි. අනෙක් සියළුම ගණයන් හි (පාලනය කැරෙන ගෙවල් උපයෝගි කරගනු ලබන ගෙවල් කුලී පිළිබඳව හැර) මිල සාමාන්‍යය අඩුවන අතට හැරී ඇත. ආහාර, තුනපහ, කුළුබඩු, මාෂ භෝග,

බටර්, අර්තාපල් වැනි මුලුමනින්ම වාගේ ආනයනය කරනු ලබන ද්‍රව්‍ය වලද, අලවගී, හරක් මස්, එළුමස්, බිත්තර, පොල් හා පොල්තෙල් යන ද්‍රව්‍ය වලද මිල වැඩිවීම් සටහන් විය. 1965 දී කෝපි ඇට, රතුළූනු, ක්‍රාප්ට් කේජු, බිස්කෝතු, හා මාළු හා කරවල යන ආහාර වර්ගවල මිල සැලකිය යුතු අන්දමින් අඩුවිය.

දෙවැනි පරිශිෂ්ටයෙහි 34 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි, 1965 සඳහා වූ ආහාර පාන ආනයන පරිමා දර්ශකය, 1964 සඳහා වූ දර්ශකයට වඩා සියයට 38 කින් අඩුවිය. එසේ වුවද, මෙම ගණයේ ආනයන මිල දර්ශකය 1965 දී අඩුවී ඇත. ආනයන මිල අඩුවූයේ වී මුත්, දර්ශකයට ඇතුලත් නොවන භාණ්ඩ ඇතුළු ආනයන භාණ්ඩ සමහරක සිල්ලර මිල ඉහළ ගොස් ඇත. සලාක අඩු කිරීම නිසා ඇතිවූ භාණ්ඩ හිඟය, වෙළෙන්දෝ සමහර ආනයන භාණ්ඩවල මිල වැඩිකිරීම සඳහා අවස්ථාවක් කොට ගත්හ. නිදසුනක් වශයෙන්, අඩු කරනලද බටර් සලාකය යථා තත්ත්වයට පැමිණවීමෙන් පසුවද, කලින් වැඩිවූ මිල පහල වැටුනේ ඉතා සෙමිනි. පොල් නිෂ්පාදිතවල අපනයන මිල ඉහල යාමෙන් ඇතිවූ බලපෑම නිසා දේශීය වෙළෙඳ පොළෙහි පොල් හා පොල්තෙල් මිල ඉහල මට්ටමක පැවැතිණි. අස්වැන්න පාළුවීම හේතුකොටගෙන මෙම වර්ෂය තුළදී එළවළු මිල අධික විය. ධීවර සංස්ථාව විසින් සිල්ලර වෙළෙඳ සැල් විවෘත කිරීම හේතුකොටගෙන මිල ගණන් සීමාවීම මාළු මිල පහළ වැටීමට හේතු වූවා විය හැකිය.

1965 ට පෙරාතුවවූ දශකය තුළදී ජීවන වියදම් දර්ශකය ඉහල යාම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ රෙදි පිළි මිල ශීඝ්‍රයෙන් වැඩිවීමය. එසේ වුවද 1965 දී රෙදිපිළි මිල ඉකුත් වර්ෂයේදී පැවති මිලට වඩා සුළු වශයෙන් පහළ වැටිණි. මෙසේ මිල අඩුවීමක් ඇතිවූයේ රෙදි පිළි ආනයන පරිමාව 1964 දීට වඩා 1965දී අඩුව තිබියදී හා රෙදි පිළිවල ආනයන මිල වැඩිවී තිබියදීත්ය. රෙදි කූපනයකට නිකුත් කරන ලද වැඩිකළ සලාකය, දර්ශකය පහළ වැටීම කෙරෙහි තරමක් දුරට හේතු වූවා විය හැකිය. මේ සම්බන්ධයෙන් දැක්විය හැකි තවත් කරුණක් නම් 1964 දී ආනයනය කැරුන සාපේක්ෂක වශයෙන් විශාලවූ රෙදිපිළි ප්‍රමාණය, සඟවා තැබූ භාණ්ඩ එළියට ගැනීමෙහි ලා රජය විසින් අනුගමනය කරන ලද පියවරවල් මගින් වෙළෙඳ පොළට ගෙන ඒමය.

ඉන්ධන හා එළිය ගණයෙහි මිල දර්ශකය සියයට 1·5 කින් පහළ වැටී ඇති අතර, එම අඩුවීම කෙරෙහි මුළුමනින්ම හේතු වූයේ රජය විසින් භූමිතෙල් සඳහාවූ ආනයන බදු සම්පූර්ණයෙන්ම අවලංගු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් භූමිතෙල් මිල අඩුවීමය. විවිධ ගණයෙහිවූ ශීර්ෂවල සාමාන්‍ය මිලද මෙම වර්ෂය තුළ සුළු වශයෙන් අඩුවිය. මෙම ගණය යටතේ කොණ්ඩා කැපිලි හා සුවඳ විලවුන් සම්බන්ධයෙන් සැලකිය යුතු මිල වැඩිවීමෙක් දක්නට ලැබුන අතර, බයිසිකල් ටයර් මිල පහළ වැටීම හේතුකොටගෙන ගමනාගමනය සම්බන්ධයෙන් ඒ සමානම සැලකිය යුතු මිල අඩුවීමෙක් දක්නට ලැබිණි.

මිල කෙරෙහි කෙළින්ම බලපෑමක් ඇති කැරෙන, වරායේ බඩු පැටවීම හා ගොඩ බෑම වර්ෂය මුළුල්ලේම වැඩි දියුණු වෙමින් පැවතිණි. වරායෙන් ඉක්මනින් බඩු ඉවත් කිරීමෙහි ලා ඇතිවූ දියුණුවීම හේතුකොටගෙන කෙටි කාලීන මිල උච්චාවචනයන් එක්තරා ප්‍රමාණයකට අඩුවිය. වරායේ තත්ත්වය වැඩි දියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒකාබද්ධ නැව් සමාගම් විසින් පනවන ලද නැව් අධිභාරයන් අවසාන වශයෙන් ඉවත් කැරිණි. එසේ වුවද, අධිභාරය අවලංගු කිරීම හේතුකොටගෙන ඇතිවූ වාසිය, වෙළෙඳුන් විසින් පාරිභෝගිකයාට දුන් බවට සාක්ෂි නොමැත.

1965 වර්ෂයේදී මිල පාලන කටයුතු වැඩිවීමෙක්ද දක්නට ලැබිණි. එවකටත් පාලනය යටතේ පැවති ශීර්ෂවලට අතිරේක වශයෙන්, ශීර්ෂ විශාල සංඛ්‍යාවක් මිල පාලනයට යටත් කරනු ලැබින. සඟවා තිබූ හිඟ බඩු ඇල්ලීමේ ව්‍යාපාරයක් පොලිස්, මිල පාලන හා ආහාර දෙපාර්තමේන්තුවල නිලධාරීන් විසින් පවත්වාගන යනු ලැබින. සාමාන්‍යයෙන් සිල්ලර වෙළෙඳුන් පාලනය කිරීම උදෙසා මිල පාලන පැනවීමෙහිදී ඒ හේතුකොටගෙන භාණ්ඩ බෙදා හැරීම බිඳ වැටුනු අවස්ථාවන් 1965 වර්ෂය තුළදී දක්නට ලැබින. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ ලාභවලින් ප්‍රමාණාධික කොටසක් ගනු ලබන තොග වෙළෙඳුන් පාලනය කිරීමේ අපහසුකමය.

**ජීවන වියදම් දර්ශකයට නොගැණෙන මිල.**

ජීවන වියදම් දර්ශකයට ඇතුලත් වන මිල ගණන් වලට අතිරේකව, මහ බැංකුව විසින් ගොඩනැගිලි උපකරණ, තෙල් හා සායම් වර්ග, ගෘහ භාණ්ඩ (ලීබඩු, මහණ යන්ත්‍ර, භාජන, කෝප්ප හා පිඟන් ආදිය) මෝටර් රථ උපාංග හා අමතර කොටස්, සහ පොහොරවල සිල්ලර මිල එකතු කරනු ලැබේ. පොහොරවල මිල හැර මෙකී සියළුම වර්ගවල මිල 1965 වර්ෂය තුළදී වැඩිවිය. බැංකුව විසින් එකතු කැරුන සංඛ්‍යා අනුව, 1965 අධිකම මිල වැඩිවීම සටහන් වූයේ 1964 දීත් අධික මිල ගණන් වලට විකුණනු ලැබූ, මෝටර් රථ උපාංග හා අමතර කොටස් සම්බන්ධයෙනි. තෙල් හා සායම් වර්ගවල මිල වැඩිවීම ද අධික විය.

වැටුප්

වැටුප් අනුපාතික දර්ශකයක් ලබාගත හැක්කේ, රජයේ සේවකයන් හා පඩි පාලක සහා යටතේ නියුතු සේවකයන් සම්බන්ධයෙන් පමණෙකි. 1958 සිට රජයේ සේවකයන්ගේ හා පාසල් ගුරුවරුන්ගේ වැටුප් අනුපාතිකයන් නොවෙනස්ව පැවති බැව් II (උ) 2 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙයි. ජීවන වියදම් දර්ශකය සුළු වශයෙන් ඉහළ යාම හේතුකොටගෙන 1965 දී ඔවුන්ගේ මූර්ත වැටුප් දර්ශකයන් පහළ වැටිණි.

**සංඛ්‍යා සටහන II (උ) 2**

**රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශක අංක**

**(1952=100)**

| කාලච්ඡේදය | ලිපිකරු හා කාර්මික සේවකයෝ | | සුළු සේවකයෝ | | මහආණ්ඩුවේ සේවකයෝ (අ) | | රජයේ පාසල් ගුරුවරු | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකයන් | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකයන් | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකයන් | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකයන් |
| 1956 .. .. .. | 108·7 | 108·5 | 113·0 | 112·8 | 111·0 | 110·8 | 113·2 | 113·0 |
| 1957 .. .. .. | 111·2 | 108·2 | 116·0 | 112·8 | 113·8 | 110·7 | 113·9 | 110·8 |
| 1958 .. .. .. | 122·3 | 116·5 | 130·4 | 124·3 | 126·7 | 120·7 | 117·4 | 111·8 |
| 1959 .. .. .. | 122·3 | 116·3 | 130·4 | 124·0 | 126·7 | 120·4 | 117·4 | 111·6 |
| 1960 .. .. .. | 122·3 | 118·2 | 130·4 | 126·0 | 126·7 | 122·4 | 117·4 | 113·4 |
| 1961 .. .. .. | 122·3 | 116·7 | 130·4 | 124·4 | 126·7 | 120·9 | 117·4 | 112·0 |
| 1962 .. .. .. | 122·3 | 115·0 | 130·4 | 122·6 | 126·7 | 119·2 | 117·4 | 110·4 |
| 1963 .. .. .. | 122·3 | 112·4 | 130·4 | 119·9 | 126·7 | 116·5 | 117·4 | 107·9 |
| 1964 .. .. .. | 122·3 | 109·0 | 130·4 | 116·2 | 126·7 | 112·9 | 117·4 | 104·6 |
| 1965 .. .. .. | 122·3 | 108·7 | 130·4 | 115·9 | 126·7 | 112·6 | 117·4 | 104·4 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(ආ) ලිපිකරු හා කාර්මික සේවකයන්ගේ හා සුළු සේවකයන්ගේ ඒකාබද්ධ දර්ශකය.

සියළුම පඩිපාලක සභා යටතේ නියුතු සේවකයන්ගේ අවම වැටුප් අනුපාතික දර්ශකය II (උ) 3 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි. දර්ශකයන් හි දැක්වෙන වැඩිවීම්වලට මුළුමනින්ම හේතුවී ඇත්තේ ජීවන වියදම් දර්ශකය පදනම් කරගෙන වැඩි කරන ලද දීමනාවන්ය. කෘෂිකර්මාන්තයෙහි නියුතු කම්කරුවන් හා කර්මාන්තවල නියුතු කම්කරුවන් සම්බන්ධයෙන් වැඩි කරන ලද දීමනා, ජීවන වියදම වැඩි වීමෙන් ඇතිවූ බලපෑම මකාලීමට තරම් ප්‍රමාණවත් නොවූ බැව් 1965 සඳහා වූ මූර්ත වැටුප් දර්ශකයන් හා 1964 සඳහා වූ මූර්ත වැටුප් දර්ශකයන් සැසඳීමේදී පෙනීයයි. එහෙත්, දීමනාවල සාමාන්‍ය වැඩිවීම, 1965 වර්ෂය තුළදී දර්ශකය නොවෙනස්ව පවත්වා ගැනීමට ප්‍රමාණවත් වූ බැව් වාණිජ කටයුතුවල නියුතු, පඩිපාලක සභා යටතට ගැනෙන කම්කරුවන්ද ඇතුළත් වන මූර්ත වැටුප් පිළිබඳ පොදු දර්ශකයෙන් පිළිබිඹු වෙයි.

### සංඛ්‍යා සටහන II (උ) 3

### පඩිපාලක සභා යටතට ගැනෙන කර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ අවම වැටුප් අනුපාතික දර්ශක අංක

### (1952 = 100)

| කාලච්ඡේදය | කෘෂිකාර්මික කම්කරුවෝ | | කර්මාන්තවල නියුතු කම්කරුවෝ | | සියලු පඩි පාලක සභා කර්මාන්තයන්හි නියුතු කම්කරුවෝ (අ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතිකය දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| 1956 .. .. | 107·1 | 106·9 | 102·9 | 102·7 | 106·4 | 106·2 |
| 1957 .. .. | 108·7 | 105·6 | 104·5 | 101·5 | 107·8 | 104·7 |
| 1958 .. .. | 110·2 | 105·2 | 116·1 | 101·9 | 110·8 | 105·6 |
| 1959 .. .. | 110·2 | 104·8 | 128·8 | 122·4 | 112·3 | 106·7 |
| 1960 .. .. | 110·2 | 105·5 | 128·1 | 123·8 | 111·8 | 108·0 |
| 1961 .. .. | 110·7 | 105·6 | 128·4 | 122·5 | 112·3 | 107·2 |
| 1962 .. .. | 111·9 | 105·2 | 129·5 | 121·8 | 113·7 | 106·9 |
| 1963 .. .. | 113·3 | 104·2 | 130·9 | 120·3 | 115·2 | 105·9 |
| 1964 .. .. | 116·0 | 103·5 | 132·8 | 118·4 | 117·8 | 105·0 |
| 1965 .. .. | 116·3 | 103·4 | 132·8 | 118·0 | 118·2 | 105·0 |

සංඛ්‍යා: කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) කෘෂිකාර්මික කම්කරුවන් සහ කර්මාන්තවල හා වාණිජ කටයුතුවල නියුතු කම්කරුවන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.